**රසායන විද්‍යාව**

**ආචාර්ය එන්. එම්. එස්. සිරිමුතු**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2018**
**ආදර්ශ ප්‍රශ්න පත්‍රය I කොටස**

කාලය : පැය 02 යි.

1) විකිරණශීලතාව සමග සම්බන්ධතාවක් ඇත්තේ

1) ජෝන් ඩෝල්ටන් 2) J.J. තොම්සන් 3) මාරි කියුරි 4) ලිනස් පෝලින් 5) රොබට් මිලිකන්

2) $^{75}_{33}As^{3+}$ අයනයේ අඩංගු ප්‍රෝටෝන, නියුට්‍රෝන හා ඉලෙක්ට්‍රෝන ගණන වනුයේ

1) 33, 75, 33 2) 30, 75, 30 3) 33, 42, 30 4) 30, 42, 33 5) 30, 33, 33

3) පරමාණුක ක්‍රමාංකය 37 ක් වන Rb මූල ද්‍රව්‍යයේ පවතින සංයුජතා ඉලෙක්ට්‍රෝනය විස්තර කිරීම සඳහා භාවිතා කල හැකි වන ක්වොන්ටම් අංක කුලකය වනුයේ

1) 5,0,0,+1/2 2) 5,1,0,+1/2 3) 5,1,1,+1/2 4) 6,0,0,+1/2
5) 6,1,0,+1/2

4) Al පරමාණුවක ආරෝපණය වනුයේ

1) $18.069 \times 10^{-19}$ C 2) $1.602 \times 10^{-19}$ C 3) $3.204 \times 10^{-19}$ C 4) 0.0 C
2) 96485 C

5) ඉලෙක්ට්‍රෝන සම්බන්ධව පහත සඳහන් කුමන ප්‍රකාශ / ප්‍රකාශය සත්‍ය වේද?

(1) චුම්බක ක්ෂේත්‍රයකදී ඉලෙක්ට්‍රෝන වක්‍රාකාර පථයක ගමන් කිරීමට නැඹුරු වේ.

(2) ඉලෙක්ට්‍රෝනවලට අංශුමය සහ තරංගමය ගුණ යන දෙකම ඇත.

(3) පරමාණුවකට ඉලෙක්ට්‍රෝන එකතු කිරීම හෝ පරමාණුවකින් ඉලෙක්ට්‍රෝන ඉවත් කිරීම හෝ සිදු කළ නොහැකිය.

(4) ඉලෙක්ට්‍රෝනයක වේගය, ආලෝකයේ වේගයට සමාන වේ.

(5) ඉලෙක්ට්‍රෝනවලට අංශුමය සහ තරංගමය ගුණ එක විට ඇත .

6) විශාලතම දෙවෙනි අයනීකරණ ශක්තිය ඇත්තේ පහත සඳහන් මූලද්‍රව්‍යයන් අතරෙන් කුමකටද?

(1) Na (2) Mg (3) AI (4) Si (5) Ar

7) $S_2O_8^{2-}$ අයනයේ S සහ O වල ඔක්සිකරණ අංක වනුයේ

1) +7,+7,0 2) +7,+7,-2 3) +6,+2,-2 4) +6,-2,-1
5) +6,0,-2

8) CΞC සහ C=C යන බන්ධනවල ශක්ති පිළිවෙලින් 835 $kJ\ mol^{-1}$ සහ 610 $kJ\ mol^{-1}$ වේ.
C-C බන්ධනයේ බන්ධන ශක්තිය ($kJ\ mol^{-1}$ ) සඳහා වඩාත්ම සාධාරණ අගය වන්නේ

(1)835-610 (2) 835/3 (3)610/2 (4) 610- (835-610) (5) (835+610)/5

PAPERMASTER.LK
OpenLearning
© University of Sri Jayewardenepura
Powered by Japura Media

9) $30^oC$ දි පවතින ජලය 1.5 kg නටවා ගැනිම සඳහා දහනය කල යුතු $CH_4$ ස්කන්ධය වනුයේ?
( $\Delta H^o_C [CH_4] = 882 \text{ kJ mol}^{-1}$, ජලයේ විශිෂ්ඨ තාප ධාරිතාව 4200 $J \, kg^{-1} K^{-1}$)

(1)8g (2) 8.82g (3) 16g (4)1.6g (5) 441g

10) ස්කන්ධය අනුව එතනෝල් ($C_2H_5OH$) 10% ක් අඩංගු ජලීය එතනෝල් ද්‍රාවණ 0.10 kg හි, ඔක්සිජන් පරමාණු මවුල කොපමණ අන්තර්ගත වේද? (සාපේක්ෂ පරමාණුක ස්කන්ධ **:H=1;C=12;O = 16**)

(1) 2.2 (2) 4.4 (3) 5 (4) 7.2 (5) 5.2

11) සාපේක්ෂ අණුක ස්කන්ධය 270 ක් වන, C, H සහ O පමණක් අඩංගු කාබනික සංයෝගයක ස්කන්ධය අනුව 29.6% ඔක්සිජන් අඩංගුය. මෙම කාබනික සංයෝගයේ අණුවක ඔක්සිජන් පරමාණු කොපමණ ඇත්ද? (සාපේක්ෂ පරමාණුක ස්කන්ධ H= 1; C=12;0=16)

(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5

12) මවුලික ස්කන්ධය 58 $g \, mol^{-1}$ ක් වන සාන්ද්‍රණය 0.5 $mol \, dm^{-3}$ වන A නැමති සංයෝගයේ ඝනත්වය 0.858 $g \, cm^{-3}$. එම ද්‍රාවණයේ මවුලීයතාව ගණනය කරන්න

1) 0.5 2) 0.25 3) 0.6 4)1.0 5) 0.75

13) ද්විතියික අන්තර් ක්‍රියා සම්බන්ධයෙන් වඩාත්ම නිවැරදි ප්‍රතිචාරය වන්නේ

(1) ඝන අවස්ථාවේ දී පමණක් ද්විතීයික අන්තර් ක්‍රියා ඇති වේ.
(2) ද්‍රව හෝ වායු අවස්ථාවේදී පමණක් ද්විතියික අන්තර් ක්‍රියා ඇති වේ.
(3) ද්විතියික අන්තර් ක්‍රියාවල ප්‍රබලතාව ආසන්න වශයෙන් 0.1 – 10 $kJ \, mol^{-1}$ වේ.
(4) අණු 2 ක් අතර ඇතිවන වඩාත්ම ප්‍රබල අන්තර් ක්‍රියාව $H_2O$ අණු 2 ක් අතර ඇති වේ.
(5) සමජාතීය අණු /පරමාණු 2 ක් අතර කුමන හෝ වර්ගයක ද්විතියික අන්තර් ක්‍රියාවක් ඇති වේ.

14) HCl ද්‍රාවණයක ස්කන්ධය අනුව HCl 36.5% ක් අඩංගු වේ. ද්‍රාවණයේ ඝනත්වය 1.15 $g \, cm^{-3}$ වේ. ද්‍රාවණයේ HCl සාන්ද්‍රණය, $mol \, dm^{-3}$ ඒකක වලින් කොපමණද? (H=1;Cl=35.5)

(1) 0.869 (2) 1.15 (3) 11.5 (4) 115 (5) 8.69

15) උච්චතම දැලිස් ශක්තියක් තිබේ යැයි බලාපොරොත්තු විය හැක්කේ පහත සඳහන් සංයෝග අතරින් කුමකටද?

(1) MgO (2) $Na_2O$ (3) NaF (4) $MgCl_2$ (5) CaO

16) පරමාණුක කාක්ෂික සම්බන්ධව පහත සඳහන් කුමන ප්‍රකාශ / ප්‍රකාශය සත්‍ය වේද?

(1) p - කාක්ෂික දෙකක් අතිච්ඡාදනය වූ විට, සැමවිටම $\pi$ බන්ධනයක් සෑදෙයි.
(2) s - කාක්ෂිකයක් p - කාක්ෂිකයක් සමඟ අතිච්ඡාදනය වූ විට, $\sigma$ – බන්ධනයක් හෝ $\pi$ –බන්ධනයක් හෝ සෑදිය හැකිය.
(3) s - කාක්ෂික දෙකක් අතිච්ඡාදනය වූ විට, $\sigma$ – හෝ $\pi$ –බන්ධනයක් සෑදෙයි.
(4) මුහුම්කරණයට සහභාගිවන s හා p – කාක්ෂික, එකම පරමාණුවකට අයත් විය යුතුය.
(5) $\pi$ –බන්ධන දෙකක් ඇති විට (පරමාණු දෙකක් අතර) ඒවා ශක්තියෙන් සමාන විය යුතුයි.

PAPERMASTER.LK
OpenLearning © University of Sri Jayewardenepura Powered by Japura Media

17) ආම්ලික මාධ්‍යයක දී $Na_2C_2O_4$ මවුලයක් සමඟ සම්පූර්ණයෙන් ප්‍රතික්‍රියා කිරීමට අවශ්‍ය වන $KMnO_4$ මවුල සංඛ්‍යාව වන්නේ,

(1) 5 (2) 3 (3) 5/3 (4) 3/5 (5) 2/5

18) $^{12}C$ සමස්ථානිකයෙහි 0.0240g හි තිබෙන පරමාණු සංඛ්‍යාව,

(1) $2.044 \times 10^{15}$ (2) $12.044 \times 10^{20}$ (3) $12.044 \times 10^{21}$ (4) $6.022 \times 10^{19}$
(5) $6.022 \times 10^{20}$

19) හැලජන් අම්ලයන්හි, 0.1 mol $dm^{-3}$ ජලීය ද්‍රාවණවල, $H^+$ (aq) සාන්ද්‍රණයන්ගේ නිවැරදි අනුපිළිවෙල වන්නේ පහත සඳහන් ඒවායින් කුමන එකද?

(1) HF < HCl < HBr < HI (2) HF < HCl <HBr = HI (3) HF < HCl = HBr = HI
(4) HF = HCl = HBr = HI (5) HF = HCl < HBr < HI

20) $K_2SO_4.Cr_2(SO_4)_3.12H_2O$ හි ජලීය ද්‍රාවණයක 1.04 g $dm^{-3}$ $Cr^{3+}$ අයන අන්තර්ගත වේ. මෙම ද්‍රාවණයේ $SO_4^{2-}$ සාන්ද්‍රණය, mol $dm^{-3}$ ඒකක වලින් කුමක්ද? (H=1: O=16: S=32: K=39: Cr=52)

(1) 0.01 (2) 0.02 (3) 0.03 (4) 0.04 (5) 0.05

21) C(s, diamond)→ C (s, graphite) ; ΔG = - kJ $mol^{-1}$ යන ප්‍රතික්‍රියාව පහසුවෙන් ම සිදු නොවන්නේ

(1) චතුස්තලීය වින්‍යාසය, තලීය වින්‍යාසයකට වඩා ස්ථායී හෙයිනි.
(2) දියමන්ති සතුව සහසංයුජ බන්ධන පමණක් පැවතිය ද ග්‍රැපයිට් සතුව සහසංයුජ බන්ධන වලට අමතරව වැන්ඩර්වාල්ස් බල ද පවතින හෙයිනි.
(3) ග්‍රැපයිට් සතුව විස්ථානගත ඉලෙක්ට්‍රෝන පවතින හෙයිනි.
(4) දියමන්ති, ග්‍රැපයිට් බවට පත්වීමේ ක්‍රියාවලියට අදාළ සක්‍රීයන ශක්තිය ඉහළ අගයක් වන හෙයිනි.
(5) ග්‍රැපයිට්වල එන්ට්‍රොපිය, දියමන්ති වල එන්ට්‍රොපියට වඩා විශාල හෙයිනි.

22) පහත ප්‍රතික්‍රියාව සඳහා එන්තැල්පි විපර්යාසය kJ $mol^{-1}$ වලින් වනුයේ,

$C_2H_4(g) + H_2(g) \rightarrow C_2H_6(g)$,

C-C, C=C, C-H හා H-H හි මධ්‍යයන බන්ධන ශක්තිය පිළිවෙලින් kJ $mol^{-1}$,

348, 612, 412 හා 436 වේ.

1) + 560 (2) -124 (3) -224 (4) +124 (5) -560

23) පරිපූර්ණ වායු සම්බන්ධව අසත්‍ය වන්නේ

(1) එකිනෙක ප්‍රතික්‍රියා නොකරන වායු මිශ්‍රණයක මුළු පීඩනය එක් එක් සංඝටකයේ ආංශික පීඩනවල එකතුවට සමානය.
(2) රසායනික ප්‍රතික්‍රියාවක දී නිපදවෙන වායූන් එක ම උෂ්ණත්වයේ දී හා පීඩනයේදී මැනෙන්නේ නම් ඒවායේ පරිමා අතර අනුපාතය කුඩා පූර්ණ සංඛ්‍යාමය අනුපාතයකි.
(3) පීඩන එදිරියේ පරිමාව ප්‍රස්තාරගත කළවිට ප්‍රස්තාර රේඛාව (0, 0) හරහා ගමන් කරයි.
(4) කෙල්වින්වල මනින ලද උෂ්ණත්වය එදිරියේ පරිමාව ප්‍රස්තාරගත කළ විට ප්‍රස්තාර රේඛාව උෂ්ණත්වය අක්ෂය කපන්නේ නිරපේක්ෂ ශුන්‍යයේ දී ය.
(5)උෂ්ණත්වය හා පීඩනය එකම වන විට අසමාන වායූන් දෙකක සම පරිමා තුළ සමාන අණු සංඛ්‍යාවක් අඩංගු වේ.

PAPERMASTER.LK
OpenLearning Powered by Japura Media

**24)** 2A+B→ 2D යනු තනි පියවර ප්‍රතික්‍රියාවකි. A හ B වල දෙන ලද සාන්ද්‍රණ සඳහා ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතාවය R වලට සමාන වේ. A හ B වල සාන්ද්‍රණ දෙගුණ කළ විට ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතාවය විය හැක්කේ,

(1) 2R (2) 4R (3) 8R (4) $4R^2$ (5) $R^2$

**25)** $CuSO_4$ හා $ZnSO_4$ අඩංගු තනුක ද්‍රාවණයක සංශුද්ධ Mg පටියක් ගිල් වූ විට නිරීක්ෂණය කිරීමට වඩාත් ම ඉඩ ඇත්තේ,

(1) ද්‍රාවණයේ පැහැය වැඩිවීමයි.
(2) ද්‍රාවණයේ පැහැය වෙනස් නොවී පැවතීමයි.
(3) Mg පෘෂ්ඨය මතුපිට Cu තැන්පත් වීමයි.
(4) Mg පෘෂ්ඨය මතුපිට Zn තැන්පත් වීමයි.
(5) Mg පෘෂ්ඨය මතුපිට Cu සහ Zn යන දෙක,එක විට ම තැන්පත් වීමයි.

**26)** අයන සංචරණය මඟින් සැලකිය යුතු විද්‍යුත් සන්නයනයක් පෙන්වන්නේ පහත සඳහන් ඒවායින් කුමක්ද?

(1) කොපර් කම්බිය (2) ඝන NaCl (3) ග්‍රැපයිට් (4) පොලිවයිනයිල් ක්ලෝරයිඩ්
(5) විලීන NaOH

**27)** $K^{127}I$ සාන්ද්‍රණය 1.0 mol $dm^{-3}$ ද, $K^{129}I$ සාන්ද්‍රණය 0.1 mol $dm^{-3}$ ද, වන ජලීය ද්‍රාවණයක් විද්‍යුත් විච්ඡේදනය කළ විට, විසර්ජනය වන අයඩීන්වල සංයුතිය වන්නේ

**1)** $^{127}I_2$ **සහ** $^{129}I_2$ **වල මිශ්‍රනයක්**
**2)** $^{127}I_2$ **,** $^{129}I_2$ **සහ** $^{127}I_2{}^{129}I_2$ **වල මිශ්‍රනයක්**
**3)** $^{127}I_2$
**4)** $^{129}I_2$
**5) 5)** $^{127}I_2{}^{129}I_2$

28) සම්මත ඉලෙක්ට්‍රෝඩය ලෙස කැලමල් ඉලෙක්ට්‍රෝඩය භාවිතා කල විට $Zn/Zn^{2+}$ වල $E^o$ ගනනය කරන්න ($E^o_{Zn2+/Zn}$= - 0.76 V and $E^o_{SCE}$ = 0.24 V)

1) – 0.76 V, 2) -0.52 V 3) 0.0 V 4) – 1.0 V 5) 1.0 V

29) 34) පහත සඳහන් සන්යෝග අතරින් වැඩිම භාස්මිකතාවයක් පෙන්වන්නෙ කුමන සන්යොගයද?


(1) බෙන්සැල්ඩිහයිඩ් (2) ඇනිලින් (3) මෙටා නයිට්රො ඇනිලින්
(4) පැරා නයිට්රො ඇනිලින් (5) බෙන්සිල් ඇමයින්

30) $CH_2$=CH-$CH_2$-$CH_2$-CO-$CH_3$ යන සන්යොගයේ නිවැරිදි IUPAC කුමක්ද

(1) 5 – Hexan -2-one (2) Hex-5-en-2-one (3) 5-Oxohex-1-ene
(4) Hex-5-ene-2-one (5) 1-Hexen-5-one

PAPERMASTER.LK
OpenLearning Powered by Japura Media

31) පහත සඳහන් a,b,c,d,e යන සන්යෝග නයිට්‍රො කරනයට භාජනය කලහොත් නයිට්‍රොඑලයක්ලබා දීමේ හැකියාව අඩු වන අනුපිලිවෙලට පහත සන්දන් කුමක් පෙන්නුම් කරයිද?




1) a,b,c,d,e (2) a,d,c,e,b (3) b,e,c,a,d (4) c,d,a,e,b (5) d,a,c,e,b

32) ප්‍රතික්‍රියාවක පෙළ සම්බන්ධයෙන් සත්‍ය වන්නේ

a) එයට භාගමය අගයන් ගත හැකග
d) එය සෑම විටම පරීක්ෂණාත්මකව මැනිය යුතය
c) එය සෛද්ධාන්තික අගයක් වන අතර තුලිත රසායනික ප්‍රතික්‍රියාව දෙස බලා ගත හැකග
d) එය ප්‍රතික්‍රියක වල සාන්ද්‍රණය මත රඳයි


33) පහත සඳහන් ද්‍රාවණ යුගල මිශ්‍ර කිරීමේදී අවක්ෂේපයක් ඇතිවන්නේ ,

a) Ba $cl_2$ (aq) සහ $NaNO_3$ (aq)
b) KBr (aq) සහ $MgSO_4$ (aq)
c) Ba $Cl_2$ (aq) සහ $K_2SO_4$ (aq)
d) $Ca(NO_3)_2$ (aq) සහ $K_2CO_4$ (aq)

34) පද්ධතියේ එන්ට්‍රෝපි වෙනස ධන අගයක් ගන්නේ පහත ක්‍රියාවලි/ ක්‍රියාවලින් කවරක්ද?

a) අයිස් දියවීම
b) $Na_2SO_4$ මවුල 1ක් හා $BaCl_2$ මවුල 1ක් ජලීය මාධ්‍යයේ ක්‍රියා කිරීම
c) $HNO_3$ මවුලයක් හා KOH මවුලයක් 1ක් ජලීය මාධ්‍යයේ ක්‍රියා කිරීම
d) $Li_2CO_3$ මත තාපයේ ක්‍රියාව.

35) පහත සඳහන් ප්‍රස්ථාර වගින් කුමක් නියත උෂ්ණත්වයේදී පරිපූර්ණ වායු හැසිරීම ලැබේද?





PAPERMASTER.LK
OpenLearning Powered by Japura Media

36) $Ag^+(aq)$ ජලීය ද්‍රාවනයකට NaCl ජලීය ද්‍රවනයක් එකතු කිරීමේදී AgCl අවක්ෂේප වීම සම්බන්ධයෙන් සත්‍ය වන්නේ.

a) $\Delta S_{r\,=\,-}$
b) $\Delta G = 0$
c) $\Delta H = \Delta G$
d) $\Delta G < 0$

37) විෂම පරමාණුක  දැලිසක් නොවන්නේ .

a) $I_2\,(g)$
b) දියමන්ති
c) $CO_2(s)$
d) $SiO_2$


38 වායුමය කලාපයේදී පහසුවෙන් ද්වි අණුක තත්වයට පත්වන්නේ.


a) $CO_2$
b) NO
c) $H_2$
d) $NO_2$


39) *සම්මත ඉලෙක්ට්‍රෝඩ විභවය -2.7 V, -1.7 V සහ 0.8 V වන සම්මත ලෝහ- ලෝහ අයන ඉලෙක්ට්‍රෝඩ 3 ක් සපයා ඇත.මෙම ඉලෙක්ට්‍රෝඩ යුගල වශයෙන් යොදමින් නිර්මාණය කළ හැකි සියලු විද්‍යුත් රසායනික කෝෂ සඳහා නිවැරදි වන්නේ*


(a) කෝෂ 4 ක් පමණක් නිර්මාණය කළ හැකිය
(b) *එක් ඉලෙක්ට්‍රෝඩයක් පමණක් වෙනස් කෝෂ 2 ක ඇනෝඩය ලෙස ක්‍රියා කරයි*
(c) *එක් ඉලෙක්ට්‍රෝඩයක් පමණක්, එක් කෝෂක ඇනෝඩය ලෙෂ ද තවකක කැතෝඩය ලෙස ද ක්‍රියා කරයි*
(d) *කෝෂ 3 ක් පමණක් නිර්මාණය කළ හැකිය*


40) පහත සඳහන් සන්යොග අතරින් ඇල්ඩොල් සන්ඝනනයට භාජනය විය හැක්කෙ කුමන සන්යොගයකටද?


1


2







3


4


5

PAPERMASTER.LK
OpenLearning Powered by Japura Media

41) සා.$HNO_3$ හා සා.$H_2SO_4$ මිශ්‍රනයක් මගින් බෙන්සීන් නයිට්‍රොකරනය කල විට අතර මැදියක් ලෙස සැදෙන්නෙ?

(1)  (2)  (3)  (4)  (5) 

**පහත ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද සදහන් කරන්න**

42) එන්තැල්පිය මෙන්ම එන්ට්‍රොපිය ද අවස්ථා ශ්‍රිතයකි

43) 0.01 mol $dm^{-3}$ HCl ද්‍රාවණයක pH අගයට වඩා 0.01 mol $dm^{-3}$ $H_2SO_4$ ද්‍රාවණයක pH අගය අඩුය

44) තනුක ජලීය ද්‍රාවණවල $H_2SO_4$, HCl ට වඩා ප්‍රබල අම්ලයකි

45) $20^oC$ දි ජලයෙහි ග්ලූකෝස් ද්‍රාවණයක මවුලීයතාවය $30^oC$ දි එම ද්‍රාවණයේ මවුලීයතාවයට සමාන වේ

46) ජලය 1 $dm^3$ ක ද්‍රාවිත NaOH මවුල 0.1 ක් අඩංගු NaOH ද්‍රාවණයක සාන්ද්‍රණය 0.1 mol $dm^{-3}$ වේ

47) තාපදායක ප්‍රතික්‍රියාවක ශීඝ්‍රතාවය උෂ්ණත්වත් සමග වැඩි වේ

48) දෙන ලද ශක්තියට වඩා ශක්තියෙන් වැඩි අණු භාගය උෂ්ණත්වය සමග වැඩි වේ
49) උෂ්ණත්වය වැඩිවීමත් සමග ප්‍රතික්‍රියාවක ශීඝ්‍රතාවය වැඩි වේ

50) සමහර ලවණ සීතල ජලයෙහි අද්‍රාව්‍ය වන නමුත් රත් කළ විට ජලයෙහි දිය වේ

51) උත්ප්‍රේරකයක් ප්‍රතික්‍රියාවක එන්තැල්පිය අඩු කරයි

52) HCl ප්‍රබල අම්ලයක් වන අතර එහි සංයුග්මක භෂ්මය වන $Cl^{-1}$ ද ප්‍රබල භෂ්මයකි

53) ප්‍රතික්‍රියාවකදි ප්‍රතික්‍රියක වලින් 100% ක් ඵල බවට පත්වේ

54) තාප අවශෝෂක ප්‍රතික්‍රියාවක සීඝ්‍රතාවය උෂ්ණත්වය වැඩිවන විට වැඩි වේ

55) සමහර ප්‍රතික්‍රියා වලදි ඵලදාව 50 % ක් පමණ විය හැක

56) ස්වයංසිද්ධ ප්‍රතික්‍රියා ඉතා සීඝ්‍රයෙන් සිදුවේ

57) ඉතා සීඝ්‍රයෙන් සිදුවෙන ප්‍රතික්‍රියා වල ඵලදාව ඉතා වැඩිය

58) සමහර ස්වයංසිද්ධ ප්‍රතික්‍රියා වල සීඝතාව නොගෙනිය හැකි තරම් කුඩාය

PAPERMASTER.LK
OpenLearning Powered by Japura Media

59) ප්‍රතික්‍රියාවක සීඝතාව ප්‍රතික්‍රියක වල සාන්ද්‍රණය වැඩි කරන විට වැඩි වේ

60) ඉලෙක්ට්‍රෝඩයක ඉලෙක්ට්‍රෝඩ විභවය උෂ්ණත්වය මත රඳා නොපවති

61) ඉලෙක්ට්‍රෝඩයක ඉලෙක්ට්‍රෝඩ විභවය ද්‍රාවණයේ සාන්ද්‍රණය අඩු කරන විට වැඩි වේ

62) බොහෝ මූලද්‍රව්‍යවල පළමු වන ඉලෙක්ට්‍රෝන බන්ධුතාව සෘණ අගයක් ගනියි

63) දෙ වන ඉලෙක්ට්‍රෝන බන්ධුතාව සැම විට ම ධන අගයක් ගනියි

64) සහ සංයුජබන්ධන වලට බාධා හයිඩ්‍රජන් බන්ධන ප්‍රබල වේ.

65) S ගොනුවේ මුල ද්‍රව්‍ය වල විකිරණශීලී මුල ද්‍රව්‍ය අඩංගු නොවේ.

66) ආයතනික දැලිය තුල වැන්ඩවැල්ස් බල ඇත

67) d ගොනුවෙ මූලද්‍රව්‍යක් අඩංගු සංයෝග වල ජලීය ද්‍රාවණ සැමවිටම වර්ණයක් ගනී

Prepared by
Dr. N.M.S Sirimuthu,
B.Sc (USJP), PhD (Queen's University,Belfast,UK),MRSC
Senior Lecturer, Head of the Department: Department of Sports, FAS
Coordinator: Medical Laboratory Science (MLS),FMS
Department of Chemistry,
Faculty of Applied Sciences,
University of Sri Jayewardenepura, Sri Lanka,

Tel: 0719728167

PAPERMASTER.LK
OpenLearning © University of Sri Jayewardenepura Powered by Japura Media